CENTRE FOR MONITORING ELECTION VIOLENCE
මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்
No 6/5, Layards Road, Colombo 05, **Tel:** +094-11 3010664
**Fax**: +094-11 2505228 **E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2018,

## මාධ්‍ය නිවේදනය - 02

*2018 ජනවාරි මස 28 වැනි දින : පැය 09.00, කොළඹ, ශ්‍රී ලංකාව*

නව මැතිවරණ ක්‍රමයක් යටතේ පැවැත්වීමට නියමිත පළාත් පාලන ඡන්ද විමසීම මෙරටේ මැතිවරණ ඉතිහාසයට එක්වනු ඇත්තේ සුවිශේෂී නවාංගයන් රැසක් හඳුන්වා දුන් ඡන්ද විමසීමක් ලෙසය. එහිලා වැඩි අවධානයක් යොමුව ඇත්තේ කාන්තා දේශපාලන සහභාගීත්වය වඩාත් දිරිමත් කිරීමේ අරමුණින් නීතිගත කරණු ලද 25% ක් වන කෝටාව කෙරෙහිය.

නව මැතිවරණ ක්‍රමය යටතේ කාන්තා නියෝජනය සාක්ෂාත් කරලීම සඳහා ප්‍රමුඛතම වගකීම පැවරී ඇත්තේ මැතිවරණ කොමිෂන් සභාව වෙත වන අතර ඒ සඳහා දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් තම උපරිම සහාය එකී කොමිෂන් සභාව වෙත ලබාදීම අවශ්‍යයෙන් ම සිදුවිය යුත්තකි.

කරුණු එසේ වුවද ඒ ඒ දේශපාලන පක්ෂ, අපේක්ෂකයන් හා ඡන්දදායකයන් තුළ පවා අද දක්වා ද කාන්තා දේශපාලන සහභාගීත්වය පිළිබඳව මුල්බැස ගෙන ඇති දුර්මත බොහෝ ය. ඉන් ප්‍රමුඛතම අදහසක් වන්නේ මෙලෙස ඉතිහාසයේ ප්‍රථමවතාවට ලබාදෙන ලද කෝටාව මගින් පවා අර්ථාන්විත කාන්තා නියෝජනයක් සිදු නොවන බවයි.

ඊට නිදසුන් ලෙස කාන්තා ක්‍රියාකාරිනියන් සහ සංවිධාන දක්වන අදහසක් වන්නේ කොට්ඨාශ සඳහා තරග කොට ජය ගන්නා අපේක්ෂකයන් හැර අනෙකුත් කවර අපේක්ෂකයෙක් හෝ පත් කිරීම සඳහා ඒ ඒ දේශපාලන පක්ෂ ලේකම්වරුන් හා ස්වාධීන කණ්ඩායම් නායකයන් වෙත නව සංශෝධන පනත මගින් හිමිකර දී ඇති බලයයි. එහි වඩාත් අහිතකර තත්ත්වය වන්නේ එකී බලය වක්‍රාකාරව උයෝගී කරගනු ලබන්නේ ඒ ඒ දේශපාලන පක්ෂවල ආසන සංවිධායකවරුන් වීමයි. එකී විවේචන පහසුවෙන් බැහැර කළ හැකි ඒවා නොවේ.

කෙසේ වුවත් කවර ආකාරයෙන් හෝ නව පළාත් පාලන ආයතන සඳහා පත්වීමට නියමිත අවම කාන්තා සභික ප්‍රමාණය 1985 ක් වන අතර මෙරටේ කාන්තා දේශපාලනයේ නව මානයක් විවර කිරීමේ පළමු පියවර තැබිය යුත්තේ ද මෙලෙස පළමුවරට පත්වන කාන්තා සභිකයන් සමූහය ම මිස වෙන අන් කවරෙක් හෝ නොවේ.

මෙවර ඡන්ද විමසීම තුළ කාන්තා ක්‍රියාකාරීත්වය කවරාකාරයෙන් සිදුවන්නේ ද යන්න පිළිබඳ විධිමත් නිරීක්ෂණයක් මැ.ප්‍ර.නි.ම. සිදුකරමින් පවතී. එහිලා වාර්තා වී ඇති මෙන්ම මැ.ප්‍ර.නි.මහි නිරීක්ෂණාත්මක මැදිහත් වීම තුළ දැනටමත් ගොනුකර ගෙන ඇති කරුණු සමුදායක් පවතී. මෙම කරුණු විග්‍රහ කිරීමේදී පැහැදිලි වන්නේ මෙරටේ මැතිවරණ ඉතිහාසය තුළ පළමු වරට හඳුන්වා දෙන ලද කාන්තා කෝටාව අර්ථාන්විතව උපයෝගී කර ගැනීම සඳහා මෙවර ඡන්ද විමසීම සඳහා එක්ව ඇති දේශපාලන පක්ෂවල නායකයන් සහ ආසන සංවිධායකවරුන් ඒ පිළිබඳ අර්ථාන්විත මැදිහත්වීමක් සිදුකර නැති බවයි.

අඩුවැඩි වශයෙන් යම්යම් දේශපාලන පක්ෂ කාන්තා දේශපාලන නියෝජනය සවිමත් කිරීමට හා අර්ථ ගැන්වීම සඳහා යම් වෙහෙසක් ගෙන තිබුණ ද එහිලා මැ.ප්‍ර.නි.ම වෙත වාර්තා වී ඇති සිදුවීම් අතරින් බහුතරයක් කාන්තා දේශපාලන ක්‍රියාකාරීත්වය පහත හෙලන හෝ අවතක්සේරු කරන මට්ටමේ නිෂේධනාත්මක මැදිහත්වීම් බව සඳහන් කිරීම වටී.

මෙහි පහත පළ වන්නේ මෙවර පළාත් පාලන ඡන්ද විමසීම සඳහා එක්ව ඇති අපේක්ෂිකාවන්ට මෙන්ම ඔවුන්ගේ ආධාරකාරිණියන්ට එරෙහිව සිදුවී ඇති සිද්ධීන් අතරින් මැ.ප්‍ර.නි.ම වෙත වාර්තා වී ඇති සිදුවීම් වල සංක්ෂිප්තයකි.

## කාන්තාවන්ගේ නම්, නාමයෝජනා ලැයිස්තු සඳහා ඇතුළත් කිරීම :

මැතිවරණ කාලසමයන්හි දී කාන්තාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරුණු සාකච්ඡා කිරීමක් මෙරටේ සිදුව ඇත්තේ ඉතා අල්ප වශයෙනි. ඒ අනුව පළාත් පාලන ආයතන සඳහා නාම යෝජනා කැඳවීම ප්‍රකාශට පත් කරන ලද දින සිට නාම යෝජනා ලබාදීම අවසන් වීම දක්වා නාමයෝජනා හා සබැඳි සිද්ධීන් රාශියක් මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත ලැබී ඇත.

1. විවිධ දේශපාලන පක්ෂ වලට අයත් ආසන සංවිධායකවරුන්, කාන්තාවන් හට අපේක්ෂකත්වය ලබා දෙන බවට පොරොන්දු වෙමින් කාලය ගැනීම හා නාමයෝජනා අත්සන් කරනු ලබන දිනය වන තෙක් අදාළ අපේක්ෂිකාව, නාම යෝජනා ලැයිස්තුවට ඇතුළත් කර ඇති දැයි යන්න නොපවසා ඔවුන් හට තරග කිරීමට ඇති අවස්ථාව අහිමි කිරීම.
2. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට තරග කිරීමට අවශ්‍ය අපේක්ෂකත්වය ලබා දීම වෙනුවෙන් අදාළ පාර්ශව විසින් ලිංගික අල්ලස් ඉල්ලා සිටීම.
3. නව මැතිවරණ ක්‍රමය පිළිබඳ අපේක්ෂිකාවන්ගෙන් බොහෝ දෙනෙක් සතුව පවත්නා නොදැනීම උපයෝගී කර ගනිමින් ඔවුන්, අමතර ලැයිස්තුවට (නාම යෝජනා පත්‍රයේ ii වැනි කොටසට) ඇතුළත් කිරීම අවශ්‍ය නැති බවත්, ඡන්ද ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව අදාළ කාන්තා අපේක්ෂිකාවන් හට සභිකධූරය ලබා දීමේ බලය පක්ෂ ලේකම්වරුන් ලෙස ඇති බව දක්වමින් ආසන සංවිධායකවරුන් කාන්තා අපේක්ෂිකාවන් රැවටීමට ලක් කිරීම.
4. නාම යෝජනා ලබාදී ඇති අපේක්ෂිකාවන් හට තම ප්‍රචාරක ව්‍යාපාරය ඔවුන්ගේ සිතැඟි පරිදි තමතමන්ගේ දේශපාලන පක්ෂ නායකයන්, සාමාජිකයන් හා එක්ව සැලසුම්කර ගැනීමට ඉඩක් ලබා නොදෙමින් ඔවුන් සතු ස්වාධීනව ක්‍රියාකාරීත්වයට බාධාකාරී ලෙස ආසන සංවිධායකවරුන් කටයුතු කිරීම.
5. දැනටමත් නාමයෝජනා ලැබී ඇති කාන්තා අපේක්ෂිකාවන්ගේ ප්‍රචාරක ව්‍යාපාර අඩපණ වන සේ කටයුතු කරමින් ඔවුන්ට එරෙහි පොලිස් ස්ථානවල ව්‍යාජ පැමිණිලි කිරීම සහ "ගැහැණුන්ට ඡන්දය දෙන්නට එපා යැයි" පවසා ගම්මාන සිසාරා සැරිසරන සේ උපදෙස් ලබාදෙමින් ආධාරකරුවන් යෙදවීම.

ඉහත දැක්වූ කරුණු වලට අදාළ මූලික වාර්තා මෙන්ම නිරීක්ෂණ මැ.ප්‍ර.නි.ම. සතු වන අතර මෙහි පහත පළවන්නේ ඒ අතරින් තෝරා ගත් සිද්ධීන් කිහිපයක සංක්ෂිප්තයකි.

## 2018 ජනවාරි මස 04, මඩකලපුව දිස්ත්‍රික්කය, මන්මුනෙයිපත්තු ප්‍රාදේශීය සභාව, සෙල්වනගර්, කොට්ඨාශ අංකය 05 : අපේක්ෂිකාවකගේ නිවසට ඇතුල්වී අලාභහානි සිදුකිරීම.

TMVP පක්ෂය යටතේ මෙවර පළාත් පාලන ඡන්ද විමසීම සඳහා තරග කරනු ලබන සෝමසුන්දරම් චන්ද්‍රිකා නම් අපේක්ෂිකාව ඇයගේ නිවසේ නොමැති මොහොතක නාඳුනන පිරිසක් නිවසට ඇතුල්වී මුළුතැන්ගෙයෙහි තිබූ බඩු භාණ්ඩ වලට අලාභහානි කොට පලාගොස් ඇත. ඇය ඒ පිළිබඳ

කාත්තන්කුඩි පොලීසියට පැමිණිලි කොට ඇති අතර එහි පැමිණිලි අංකය වන්නේ EIB 74/43 යන්නයි.

### වසර 2018 ජනවාරි මස 15, පුත්තලම දිස්ත්‍රික්කය : අවමන් සහගත ප්‍රකාශ සිදු කරමින් මැතිවරණ ක්‍රියාවලියට බාධා පැමිණිවීම හා අපේක්ෂිකාවන් අපහසුතාවයට පත් කිරීම :

සමාජජාලා මාධ්‍ය (Social Media) භාවිත කරමින් මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ වැරදි ප්‍රචාර මෙන්ම අපේක්ෂක අපේක්ෂිකාවන් අපහසුතාවයට පත් කරන ආකාරයේ අවමන් සහගත ප්‍රකාශ ද අන්තර්ජාලයට මුදාහැරීම මේ දිනවල සීඝ්‍රයෙන් සිදුවෙමින් පවතී. මෙදින අන්තර්ජාලයේ සංසරණය වූ වීඩියෝ පටයක දිස්වන ආකාරයට නියාස් මවුලවී නම් ආගමික පූජකවරයා ඉතා දැඩි මෙන්ම රළු වදන් භාවිත කරමින් කාන්තා දේශපාලන සහභාගීත්වය පිළිබඳව දැඩි විවේචනයක් ඉදිරිපත් කරයි.

ඊට අමතරව මෙවර පළාත් පාලන ඡන්ද විමසීම සඳහා ඉදිරිපත්ව ඇති කාන්තා අපේක්ෂිකාවන් ද බලවත් අපහසුතාවයට පත් කරමින් ප්‍රකාශ නිකුත් කරනු ලබන අතර ඔහුගේ මූලික අභිප්‍රාය වන්නේ කාන්තා අපේක්ෂිකාවන් හට ඡන්දය ලබා නොදෙන ලෙස ඡන්දදායකයන්ට බල කිරීමයි. තවද ආගමික නායකයෙක් ලෙස පෙනී සිටින මොහු ඉතා දැඩිව තම ආගමික ලබ්දිකයන්ගෙන් ඉල්ලා සිටින්නේ පුත්තලම දිස්ත්‍රික්කය, උතුරු සහ නැගෙනහිර යන පළාත් සඳහා තරඟ වදින කාන්තා අපේක්ෂිකාවන් හට ඡන්දය ලබා නොදෙන ලෙසයි.

මෙහි පවත්නා වඩාත් භයානක තත්ත්වය වන්නේ මෙම අවමන් සහගත වාග් ප්‍රහාර තුළින් කුල්මත් වන ඡන්දදායකයන් කාන්තා අපේක්ෂිකාවන් ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රවණතාවක් ඉස්මතු වෙමින් තිබීම වන අතර මේ පිළිබඳ නිසි පියවර ගන්නා ලෙස ඉල්ලා මැ.ප්‍ර.නි.ම සම කැඳවුම්කරු, ආචාර්ය පී. සරවනමුත්තු මහතා මැතිවරණ කොමිෂන් සභාවෙන් මෙන්ම පොලිස්පතිවරයාගෙන් ද ඉල්ලා ඇත.

තවද එකී ලිපියෙන් ඔහු දක්වා ඇත්තේ ඉහත නම් සඳහන් නියාස් මවුලවී නම් පූජකවරයා Jamiuththowheed හෙවත් thowheed Jamath නම් ආගමික නිකායේ ආගමික නායකයෙක් ලෙස කටයුතු කරන බවත් එකී පූජකතුමන්ගේ මෙම ක්‍රියාදාමය වහා පාලනය කිරීම සඳහා කටයුතු නොකළහොත් එය සියලු අපේක්ෂකයන් හට සමබිමක් නිර්මාණය කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව ගනිමින් සිටින උත්සාහය ව්‍යර්ථ වීමට ඉඩ ඇති බවත් ය.

තවද මැ.ප්‍ර.නි.ම මගින් සිදුකළ නිරීක්ෂණයේදී තහවුරු වූයේ මෙම වීඩියෝ පටය තම තමන්ගේ දේශපාලන ප්‍රචාරය සඳහා අනෙකුත් දේශපාලන පක්ෂවල අපේක්ෂකයන් යොදාගැනීමේ ප්‍රවණතාවක් ද ඉස්මතු වී ඇති බවයි.

### වසර 2018 ජනවාරි මස 15, පුත්තලම දිස්ත්‍රික්කය : නොරොච්චෝලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් ව්‍යාජ පැමිණිල්ලක් මත ක්‍රියාකරමින් අපේක්ෂිකාවක් අපහසුතාවට පත් වන සේ ක්‍රියා කිරීම :

ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය යටතේ තරඟ කරනු ලබන සී.ඒ. රිනූසා ඉල්මා යන අපේක්ෂිකාවගේ නිවසට පොලිස් නිලධාරීන් සිව් දෙනෙක් (04) බලහත්කාරයෙන් ඇතුල්වීමත්, ඒ සඳහා කිසිදු කාන්තා පොලිස් නිලධාරිනියක් සහභාගිකර නොගැනීමත් තුළින් එකී අපේක්ෂිකාවට යම් අගතියක් සිදු වූ බවට වන පැමිණිල්ලක් මැ.ප්‍ර.නි.ම වෙත ලැබී ඇත.

නොරොච්චෝලේ පොලීසියට අයත් මෙම නිලධාරීන් අදාළ කාන්තා අපේක්ෂිකාවගේ නිවසට ඇතුල් වී ඇත්තේ පොලිස් හදිසි ඇමතුම් අංශයට (119) ලැබුණු ඇමතුමක් ඔස්සේ බව අදාළ පොලිස් නිලධාරීන් දක්වා ඇත. එනම් එකී ඇමතුමෙන් කියවී ඇත්තේ එකී නිවසේ ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය කරන බව හා පරිඝණක රාශියක් ගබඩා කොට ඇති බවයි. එකී වැටලීම හදිසියේ සිදුවූවක් වුවද, අදාළ අපේක්ෂිකාව දිගින්දිගටම පවසා ඇත්තේ එම වැටලීම සඳහා කාන්තා පොලිස් නිලධාරිනියක් ද සහභාගී කර ගන්නා ලෙසයි.

කෙසේ වුවද එකී පොලිස් නිලධාරීන් හට කිසිදු සැකකටයුතු යමක් සොයා ගැනීමට නොහැකිව ඇත. අනතුරුව ඉහත කී අපේක්ෂිකාව තම දේශපාලන පක්ෂයේ තවත් ජ්‍යෙෂ්ඨ කාන්තා අපේක්ෂිකාවක් වන බිස්ලියා භූතෝ යන අය සමඟ පොලිස් ස්ථානයට ගොස් තමන් හට පැමිණිල්ලක් කිරීමට අවශ්‍යයැයි දක්වා ඇත. එලෙස පොලීසිය වෙත පැමිණිල්ලක් ගොනු කිරීමට අදහස් කර ඇත්තේ කාන්තා නිලධාරිනියකගේ සහායක් හෝ නොමැතිව හදිසියේ තමන්ගේ නිවස වැටලීම මගින් ඇයට යම් අපහසුතාවක් මෙන්ම අගතියක් වූ බව දක්වාලීමටය.

එහෙත් නොරොච්චෝලේ පොලීසියේ නිලධාරීන් අදාළ පැමිණිල්ල භාරගෙන නැත. ඒ වෙනුවට දක්වා ඇත්තේ පැමිණිලි ලියාගනු ලබන නිලධාරියා එදින නිවාඩු ගොස් ඇති බවයි. පසුව එකී කරුණ පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික මහාචාර්ය රත්නජීවන් හූල් මහතා වෙත දැනුම්දීමෙන් පසු පැමිණිල්ල භාරගෙන ඇති අතර එහි අංකය වන්නේ CIB I 16/125 යන්නයි. එකී පැමිණිල්ල ලියාගන්නා අවස්ථාවේදී පවා ඇය විසින් ප්‍රකාශ කරන ලද සමහර කරුණු පැමිණිල්ලේ සටහන් කිරීම අවශ්‍ය නැතැයි පැමිණිල්ල භාර ගන්නා පොලිස් නිලධාරීන් විටින් විට පවසා ඇත.

## 2018 ජනවාරි මස 20, මොණරාගල දිස්ත්‍රික්කය, වැල්ලවාය ප්‍රාදේශීය සභාව : දේශපාලන පක්ෂ ආධාරකරුවන් සහ ස්වාධීන කණ්ඩායම් අපේක්ෂකයන් අතර ඇති වී ඇති ගැටුමක් හේතුවෙන් අපේක්ෂිකාවක් තුවාල ලබා රෝහල්ගත කිරීම :

ඌව පළාතට අයත් මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය මැතිවරණ කොට්ඨාශය තුළ පිහිටි වැල්ලවාය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය සඳහා එළඹෙන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වී ඇති අපේක්ෂකයන් සහ ඔවුන්ගේ ආධාරකරුවන් අතර ඇති වූ ගැටුමක් හේතුවෙන් එකී සිද්ධියට මැදි වූ ස්වාධීන කණ්ඩායම් අපේක්ෂිකාවක් මේ වන විට රෝහල්ගත කර ඇත.

මෙකී සිද්ධිය සඳහා මැදි වූ කේ.ඒ. රේණුකා දමයන්ති වැල්ලවාය ප්‍රාදේශීය සභාව සඳහා ස්වාධීන අපේක්ෂිකාවක් ලෙස තරඟවදින සිරිපුරගම, වෙහෙරයාය පදිංචි තැනැත්තියකි. ඇය කලෙක පටන් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ප්‍රබල ආධාරකාරියක් ලෙස කටයුතු කර ඇත. අනතුරුව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ යටතේ නාමයෝජනා ලබා තරඟ කිරීමට අපේක්ෂාවෙන් සිටිය ද ඇයට එකී පක්ෂයෙන් නාම යෝජනා නොලැබී ඇති බව වාර්තා වෙයි. එකී තත්ත්වය මත ඇය ස්වාධීන අපේක්ෂිකාවක් ලෙස තම නාම යෝජනා භාර දී ඇත.

එතැන් පටන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ආධාරකරුවන් ඇය හා යම් නොපහන් බවකින් පසු වී ඇති අතර ඇයගේ ක්‍රියාකලාපයට එරෙහි වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ආධාරකරුවන් පිරිසක් සහ ඇය අතර බහින්බස් වීමක් ලෙස ඇරඹී ඇති ගැටුම කෙළවර වී ඇත්තේ එම අපේක්ෂිකාව සහ තවත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ආධාරකාරියක් තුවාල ලබා රෝහල්ගත කිරීමෙනි.

මෙකී සිදුවීමට පාදකව ඇත්තේ වසර 2018 ජනවාරි මස 16 වැනි දින රාත්‍රී 10.30 ට පමණ ඇති වූ සිද්ධියකි. ඇය තම මැතිවරණ ප්‍රචාරය සඳහා හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ රුව යොදා ගන්නා බවත් ඒවා ඇය භාවිත කරනු ලබන මෝටර් රථයේ සහ නිවසේ ප්‍රදර්ශනය කරන බවටත් වන පැමිණිල්ලක් පොලිස් හදිසි ඇමතුම් ඒකකය වෙත එනම්, 119 වෙත ලබාදී ඇත්තේ ඇයගේ අසල්වැසියෙක් වන ආර්.එම්. ලලිත් රත්නායක මහතාය. ඔහු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ආධාරකරුවෙක් වන අතර පැමිණිලිකාරියගේ ද අසල්වැසියෙකි. එකී පැමිණිල්ල විමර්ශනය කිරීම සඳහා පැමිණිලිකාරියගේ නිවසට පොලිස් නිලධාරීන් පැමිණ ඇති අතර මෙකී ගැටුම ඇරඹී ඇත්තේ ඔවුන් ද එම ස්ථානයේ සිටින අතරතුරය.

එහි අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ පැමිණිල්ල සිදු කරන ලද ලලිත් රත්නායක යන අය ස්වාධීන කණ්ඩායම් අපේක්ෂිකාවක වන රේණුකා දමයන්ති යන අයට පහරදීමයි. මේ හේතුවෙන් ඇයගේ මුහුණින් ලේ වැගිරීමක් ද සිදුව තිබූ අතර, ඇය වහා වැල්ලවාය මූලික රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව මෙතාක් ප්‍රතිකාර ලබමින් සිටී.

එකී පහරදීම නිසා කෝපයට පත්, පහර කෑමට ලක් වූ ස්වාධීන කණ්ඩායම් අපේක්ෂිකා රේණුකා දමයන්ති යන අයගේ සැමියා වූ වී.පී. අරුණ චමින්ද කුමාර යන අය ඊට ප්‍රතිචාර දක්වා අත්තේ තම බිරිඳට පහර දුන් ලලිත් රත්නායක යන අයගේ බිරිඳ වූ පුෂ්පා ශිරෝමාලා යන අයට පහර දීමෙනි. ඇය ද වැල්ලවාය මූලික රෝහලට ඇතුළත් කොට එහි ප්‍රතිකාර ලබමින් සිටී. තවද මෙම සිදුවීමට අදාළව සැකකරුවන් ලෙස අරුණ චමින්ද කුමාර සහ ආර්.එම්. රත්නායක යන දෙදෙනා අත්අඩංගුවට ගෙන වැ/ම/උ බී 11060 යටතේ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වසර 2018 ජනවාරි මස 23 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කොට ඇත.

මෙකී සිදුවීම මැතිවරණ ප්‍රචාරක කාල සමය තුළ සිදු වුවක් වුවද එහි මූලාරම්භය පූර්ව නාම යෝජනා සමය දක්වා දිවේ. තවද මෙකී සියලු දෙනා ඉතා ළඟින් එකිනෙකා ඇසුරු කරන අසල්වාසීන්ය. කාන්තා දේශපාලන සහභාගීත්වය පිළිබඳ වඩාත් වගකීම් සහගතව ක්‍රියාකරන මෙසමයේ කාන්තා අපේක්ෂිකාවකට බැන තර්ජනය කොට පහරදීම ඉතා බරපතල තත්ත්වයක් වන අතර මෙවර ඡන්ද විමසීමට අදාළව පවත්නා සාමකාමී වාතාවරණය ද මෙම සිදුවීම හේතුවෙන් යම් ආකාරයට පළුදු විය හැකි බව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ අදහසයි.

මෙම සිදුවීම සිදු වූ වහාම එහි එක් පාර්ශවයක් නියෝජනය කරන ලද ප්‍රාදේශීය මාධ්‍යවේදියෙක් එකී සිදුවීමට අදාළ වීඩියෝ පටයක් අන්තර්ජාලයට මුදාහැර තිබුණි. දෙපිරිසක් අතර ඇතිවූ ගැටුමක් වුවද ඉන් හුවා දක්වා තිබුණේ එක් පාර්ශවයක අදහස පමණි. ඒ අනුව මැතිවරණයක් පවත්නා කාලසමයක දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයන් පිළිපැදිය යුතු යැයි දක්වා මැතිවරණ කොමිෂන් සභාව නිකුත් කර ඇති මාධ්‍ය උපමාන ද එමගින් උල්ලංඝනය වී ඇත බව පෙනී යයි. තවද කවර පසුබිමක් යටතේ වුවද මෙලෙස කාන්තා අපේක්ෂිකාවන්ට සහ කාන්තා ආධාරකාරිණියන්ට බැන තර්ජනය කොට පහරදීම, කාන්තා දේශපාලන නියෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා සැලකිය යුතු මට්ටමේ නියෝජනයක් ලැබී ඇති මෙවන් අවස්ථාවක සිදු නොවිය යුතු සිදුවීමක් මෙන්ම ශිෂ්ඨසම්පන්න පුරවැසි සමාජය එකහෙළා ප්‍රතික්ෂේප කරන්නකි.

ඉහත කී සියලු කරුණු පිළිබඳ නිසි පරීක්ෂණයක් පවත්වා ඊට අදාළ නිසි ක්‍රියාමාර්ග ගැනීම පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ඉදිරි කටයුතු නිවැරදිව පවත්වා ගැනීම සඳහා ඉමහත් රුකුලක් වන බව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය අවධාරණය කර සිටී. තවද මෙවර ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් ව ඇති අපේක්ෂිකාවන් අපහසුතාවට පත්වන සේ සිදු කරන සංවිධානාත්මක කටයුතුවල යම් වර්ධනයක් මේ වන විට පෙන්නුම්කරන අතර එවැනි ක්‍රියා මැඩපැවැත්වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව ගනිමින් සිටින උත්සාහයට කාන්තා දේශපාලන ක්‍රියාකාරීත්වය පිළිබඳ මැදිහත්ව කටයුතු කරනු ලබන සිවිල් සංවිධාන මෙන්ම ක්‍රියාකාරීන් ද තම සහාය පළකිරීම ඉතා අවශ්‍යව ඇත.

## 2018 ජනවාරි මස 21, ගම්පහ දිස්ත්‍රික්කය, මීගමුව මහ නගර සභාව : අපේක්ෂිකාවකට බැන තර්ජනය කිරීම :

එක්සත් ජාතික නිදහස් පෙරමුණ යටතේ මීගමුව මහ නගර සභාව සඳහා තරඟ වදින මුතුකුඩ ආරච්චිගේ නාමලි සුසන්ති යන අපේක්ෂිකාවට බැන තර්ජනය කිරීමේ සිද්ධියක් මැ.ප්‍ර.නි.ම වෙත වාර්තා වී ඇත. මෙදින දහවල් 12.00 ට පමණ මීගමුව, කඩුවාපිටිය මංසන්ධිය අසළ පිහිටි වෙළෙඳ සංකීර්ණය අභියස දී මෙම තර්ජනය කිරීම සිදුව ඇත්තේ ඇය තම සැමියා (ඔහු ද එක්සත් ජාතික නිදහස් පෙරමුණ යටතේ මීගමුව මහ නගර සභාව සඳහා තරඟ වදින අපේක්ෂකයෙකි) සහ තවත් ආධාරකරුවන් පිරිසක් සමග ගෙන්ගෙට යමින් මැතිවරණ ප්‍රචාරණයේ යෙදෙන අවස්ථාවේදී ය. ඇයට එලෙස තර්ජනය කොට ඇත්තේ එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවෙකි. මීට අදාළව ඇය මීගමුව පොලීසිය වෙත පැමිණිල්ලක් කොට ඇති අතර ඒ පිළිබඳ විමසීමේ දී එහි පොලිස් ප්‍රකාශකයෙක් දක්වන ලද්දේ දෙපාර්ශවය ම පොලීසිය වෙත ගෙන්වා සිද්ධිය මේ වන විට සමතයකට පත් කොට ඇති බවයි.

## 2018 ජනවාරි මස 23, මඩකලපුව දිස්ත්‍රික්කය, මන්මුනෙයිපත්තු ප්‍රාදේශීය සභාව, ආරියම්පති දකුණ කොට්ඨාශය, කොට්ඨාශ අංක 04 අපේක්ෂිකාවකට එරෙහිව අවමන් සහගත සමාජජාල මාධ්‍ය ප්‍රචාරයක් දියත් කිරීම

එක්සත් ජාතික පක්ෂය යටතේ තරඟ වදින කේ. ජෙයචන්ද්‍රිකා නම් අපේක්ෂිකාවට එරෙහිව දියත් කරන ලද සැළසුම් සහගත සමාජජාල මාධ්‍ය ප්‍රචාරයක් පිළිබඳව මැ.ප්‍ර.නි.ම. වෙත වාර්තා වී ඇත. මුහුණුපොත (Facebook) උපයෝගී කරගනිමින් මෙකී අපේක්ෂිකාව පිළිබඳ විවිධ චෝදනා ඉදිරිපත් කර ඇති මෙම සාවද්‍ය ප්‍රචාරය සඳහා මූලිකවම උපයෝගී කරගෙන ඇත්තේ ඇය අදහන ආගමයි. ඇය නියෝජනය කරන ආගම සිහිකරමින් හා ඇයගේ සැමියා පිළිබඳ අසත්‍ය කරුණු සඳහන් කරමින් වරින්වර දියත්කර ඇති මෙම සාවද්‍ය ප්‍රචාරය තුළ ඇය බලවත් අපහසුතාවයට පත්ව ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මෙතෙක් ඇය පොලීසියට පැමිණිලි කොට නොමැති අතර ඒ පිළිබඳව මැ.ප්‍ර.නි.ම. මැතිවරණ කොමිෂන් සභාවේ සහ ශ්‍රී ලංකා පොලීසියේ අවධානයට ලක් කොට ඇත.

## සුවිශේෂ අවධානයකට ලකකළ යුතු ප්‍රදේශ සහ දේපාලනඥයන් පිළිබඳ නිරීක්ෂණ කිහිපයක් :

***මැතිවරණ ප්‍රචාරක රැළි පැවැත්වීම සඳහා තෝරා ගන්නා ස්ථාන මහජනතාව පීඩාවට පත්නොකරන ස්ථාන වීම :*** මැ.ප්‍ර.නි.ම. අඛණ්ඩව නිරීක්ෂණය කර ඇති පරිදි ගෙවීගිය සති දෙකක පමණ කාලයක තුළ දේශපාලන පක්ෂ නායකයන්ගේ සහභාගීත්වයෙන් පැවති මැතිවරණ ප්‍රචාරණ රැළි බොහෝ ගණනක් පවත්වන ලද්දේ නගරබද, ඉතා ජනාකීර්ණ වූ ජනයා නිරතුරු ගැවසෙන මංසන්ධීන් ආශ්‍රිතව වන අතර ඒවා සඳහා බලධාරීන් අවසර ලබා දී ඇත්තේ මහජනතාවට හිරිහැර නොවන පරිදි එවැනි ප්‍රචාරක රැළි පැවැත්වීමට වගබලා ගතයුතය යන කොන්දේසිය සමගිනි. එහෙත් මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂණය කළ පරිදි තහවුරු වූයේ එවැනි අවස්ථා වලදී ජනතාව යම් යම් පීඩාවන්ට ලක් වූ බව සහ අවසර ලබාදුන් බලධාරීන් ඒ පිළිබඳ නිසි පසු විපරමක් නොකරන බවයි.

ඒ අනුව ප්‍රචාරක රැළි සඳහා අවසර ලබා දීමේ ක්‍රමවේදය නැවත සමාලෝචනය කරන ලෙසත් ඒ පිළිබඳ යම් මාර්ගෝපදේශයක් සැපයීමට සළකා බලන ලෙස දන්වා මැ.ප්‍ර.නි.ම. මැතිවරණ කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කොට ඇත.

### සමාජජාල මාධ්‍ය ක්‍රියාකාරීත්වය

අදවන විට  සමාජජාල මාධ්‍ය සහ මැතිවරණ ප්‍රචාරණය තුළ ඇත්තේ අවියෝජනීය සබඳතාවකි. එහි වාසි මෙන්ම අවාසි ද පවත්නා අතර පසුගියදා අවසන් වූ තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීමේ මුල් වටයේ දී දක්නට ලැබුණු කරුණක් පිළිබඳ මැ.ප්‍ර.නි.ම. තම දැඩි අවදානය යොමු කර සිටී . එහිදී තම තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව රජයේ සේවකයන් කිහිපදෙනෙක් ම තමන් ඡන්දය ප්‍රකාශ කර ඇති අන්දම, ඡන්ද පත්‍රිකාවේ ඡායාරූප ගෙන සමාජජාල මාධ්‍ය වෙත මුදාහැර තිබුණි. එය මෙරටේ තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීමක දී දක්නට ලැබුණ පළමු වතාව වන අතර මෙවැනි නිලධාරීන් මැතිවරණ රාජකාරි වලින් බැහැර කොට තැබීම වඩාත් උචිත බව  මැ.ප්‍ර.නි.ම. අදහසයි.

### ඉතා සූක්ෂම ලෙස බඩු භාණ්ඩ බෙදාදෙමින් මැතිවරණ ප්‍රචාරණයේ දී යෙදීම

දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයක මැතිවරණ ප්‍රචාරණයේ යෙදෙන දේශපාලන පක්ෂ කිහිපයකට අයත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මෙන්ම කැබිනට් අමාත්‍යවරුන්

කිහිපදෙනෙකුගේ ක්‍රියාකලාපය මැ.ප්‍ර.නි.ම. තම වෙසෙස් අවධානයට ලක් කොට ඇත. මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරන එක්තරා නියෝජ්‍ය අමාත්‍යවරයෙක් අදාළ නිලධාරීන්ගෙන් ගැලවී ඡන්දදායකයන් මුළා කරමින් මැතිවරණ ප්‍රචාරණයේ යෙදෙන සූක්ෂම ආකාරයන් පිබඳව මැ.ප්‍ර.නි.ම. වෙත වාර්තා වී ඇත. මෙකී නියෝජ්‍ය අමාත්‍යවරයා මේ වනවිටත් මෙම අනිසි මැතිවරණ ප්‍රචාරයේ යෙදෙමින් සිටින අතර ඔහු ඒ සඳහා යොදාගෙන ඇති උපක්‍රමය වන්නේ ඡන්දදායකයන් ප්‍රදේශයෙන් පිටතට වන්දනා කිරීම සඳහා රැගෙන යාමයි. දැනටමත් ඔහු මෙලෙස පිටත් කර ඇති වාහන සංඛ්‍යාව 15 කි. ඊට අමතරව බඩු භාණ්ඩ බෙදාදීමේ දී අනුගමනය කරනුයේ වෙනස්ම ආකාරයේ උපක්‍රමයකි. එනම් අදාළ ඡන්දදායකයන් හට වෙළඳසැල් කිහිපයක් නම්කර ඒවායින් අදාළ භාණ්ඩ ලබාගන්නා ලෙස ගෙන් ගෙට යන අතරතුර දන්වා සිටීමයි. එය පාලනය කිරීම සඳහා අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය දැඩි පරිශ්‍රමයක් දරමින් සිටී.

තවද කෑගල්ල දිස්ත්‍රික්යේ එක්තරා කැබිනට් අමාත්‍යවරයෙක් තම පක්ෂය විසින් යොදවා ඇති අපේක්ෂකයන්ගේ ජයග්‍රහණය උදෙසා ප්‍රදේශයේ ජනතාව අතර බෙදාහැර ඇති රැකියා අයදුම්පත් ප්‍රමාණය අතිවිශාලය. මින් ඇඟවීමට උත්සාහ දරන්නේ තම පක්ෂය වෙත ඡන්දය ලබාදීම මගින් රැකියාවක් ලබාගැනීමේ මාර්ගය ඡන්දදායකයා හට විවරවන බවයි.

හම්බන්තොට දිස්ත්‍රිකකයේ පසුබිම ද ඊට දෙවෙනි නැත. වසරක් පාසා පවත්වන සමීක්ෂණයකැයි හඳුන්වමින් බෙදා ඇති සමීක්ෂණ පත්‍රිකා ප්‍රමාණය දහස් ගණනකි. එකී පත්‍රිකාව කොළඹ දිස්ත්‍රික්කයේද බෙදා දෙමින් සිටින අතර එලෙස අයදුම්පත් බෙදාදීමේ අවස්ථා කිහිපයක් ම මැතිවරණ කොමිෂන් සභාව විසින් නතර කොට ඇත. මෙහිදී වක්‍රාකාරව උත්සාහ කරනුයේ මහජනතාවගේ මූලික අවශ්‍යතා පිළිබඳව සංගණනයක් සිදුකරන්නේ යැයි පවසමින් ඔවුන්ගේ කැමැත්ත දිනා ගැනීමය.

ඊට අමතරව ගම්පහ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් තම රුව යොදාගනිමින් දැවැන්ත මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරයක් සිදුරමින් සිටින අතර එය ඇස ගැටෙන කවරෙකු හෝ වටහාගනුයේ අදාළ මන්ත්‍රීවරයා ද මෙවර පළාත් පාලන ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වන්නේ ය යන්නයි. ඔහු නිරන්තරයෙන්ම නියමිත සීමාව ඉක්මවා පාක්ෂිකයන් පිරිවරා ගනිමින් ගෙන්ගෙට යමින් මැතිවරණ ප්‍රචාරණයේ යෙදෙන අතර ඒ පිළිබඳ මැ.ප්‍ර.නි.ම අවස්ථා කිහිපයකදී ම මැතිවරණ කොමිෂන් සභාව වෙත දැනුම්දී ඇත. ඉන් එක් මැතිවරණ ප්‍රචාරක අවස්ථාවක් තුළ රජයේ වාහනයක් අවභාවිත කරමින් රාජ්‍ය ලාංඡනයක් ද උපයෝගි කරගෙන තිබූ අතර ඒ පිළිබඳ නිසි පරීක්ෂණයක් පොලීසිය විසින් මෙතෙක් පවත්වා නැත.

ඊට අමතරව බදුල්ල දිස්ත්‍රික්යේ පළාත්සභා මන්ත්‍රීවරයෙක් ද ඡන්ද විමසීම සඳහා මෙවර එක්ව ඇති තම බිරිඳගේ ජයග්‍රහණය උදෙසා දියත්කර ඇති මැතිවරණ ප්‍රචාරණය ප්‍රදේශයේ අනෙකුත් දේශපාලන පක්ෂවල මෙන්ම බහුතරයක් ඡන්දදායකයන්ගේ අප්‍රසාදයට ලක්ව ඇත. ඔහුගේ ක්‍රියාකලාපය පිළිබඳ පැමිණිලි රාශියක් මේ වනවටත් මැ.ප්‍ර.නි.ම. මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමුකර ඇත්තේ වුව ද ඔහු ඉතා සූක්ෂම අයුරින් අනිසි මැතිවරණ ප්‍රචාරණයේ යෙදීම මෙතෙක් ඡන්ද විමසීම පවත්වාගෙන එන ආකාරය පිළිබඳ විමසීමේ දී එතරම් සුභවාදී නොවේ.